සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# පෙරදිග සංගීතය

8 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01 පහත ඇත්තේ විෂය නිර්දේශිත රාගයකට අයත් එහෙත් අදාල ස්වර සංකේත නොයෙදූ රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක මුල් ස්වර පාදයයි. එම ගී පාදය, කාෆී රාගයට අයත්වීමට නම්,

ස රි / ග - ම / ප ප / ප - ස

(i) ග නි කෝමල විය යුතුය (ii) ග කෝමල විය යුතුය

(iii) ම ඉවත් විය යුතුය (iv) ම නි ඉවත් විය යුතුය

02 දෙතිතෙහි ප්‍රභේද ගණන,

(i) 05 කි. (ii) 04 කි. (iii) 03 කි. (iv) 02 කි.

03 මොර / හිඹුටු / දම් / පතා s / මෙම ගී පාදයට අදාල තිත වන්නේ,

(i) මැදුම් මහ දෙතිතයි. (ii) මහ තනි තිතයි. (iii) සුළු මහ දෙතිතයි. (iv) සුළු මැදුම් දෙතිතයි.

04 ප ප ප ප ධ ප / ම ප ම ග රි ග / මෙම ස්වර ප්‍රස්තාරයට ගැළපෙන බටහිර Time Signature වන්නේ,

(i) $3/4$ (ii) $4/4$ (iii) $6/8$ (iv) $7/8$

05 "බු ද් ධ / ං ස ර / නේ s s / s s s " මෙම ගී පාදයේ යටින් ඉරි ඇඳි කොටස හැඳින්වෙන්නේ,

(i) යතිය (ii) ලඝු මාත්‍රා (iii) ගුරු මාත්‍රා (iv) ප්ලුත මාත්‍රා ලෙසය

06 "මුණි සිරිපා සිඹිමින්නේ" මෙම ගී පාදයේ සඳැස්මත් ගණන වන්නේ,

(i) 11 කි. (ii) 12 කි. (iii) 13 කි. (iv) 14 කි.

07 නූර්ති නාට්‍ය කලාව මෙරටට හඳුන්වා දුන් ඉන්දියානු ශිල්පියා වන්නේ,

(i) විශ්වනාත් ලෞජි (ii) කාංජි ජයා ශංකර් (iii) K. බලිවාලා (iv) අබ්දුල් සතාර්

08 භූපාලි රාගයේ යෙදෙන ශුද්ධ ස්වර ගණන,

(i) 2 කි. (ii) 4 කි. (iii) 5 කි. (iv) 7 කි.

09 ගී තනු නිර්මාණය සඳහා බෙහෙවින් උත්තර භාරතීය සංගීත ශෛලිය යොදාගත් නාට්‍ය විශේෂය වන්නේ,

(i) නූර්ති (ii) නාඩගම් (iii) සොකරි (iv) කෝලම්

10 "සිරි සරුසාර කෙතේ" යන ගීතයේ පද රචනය සහ සංගීතය නිර්මාණය කළ සංගීතඥයා වන්නේ,

(i) සුනිල් ශාන්ත මහතා (ii) ආනන්ද සමරකෝන් මහතා

(iii) සුනිල් ආරියරත්න මහතා (iv) රෝහණ වීරසිංහ මහතා

- අංක 11 - සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත ස්වර පුවරුව උපයෝගී කර ගන්න. පහත දී ඇති වරහණ තුල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා අදාල හිස්තැන මත ලියන්න.




11 අංක 1 සඳහන් යතුරට (key එකට) අදාළ ස්වරය වන්නේ, .................................................................. ස්වරය යි.

12 අංක 03, 05 යතුරුවලට හිමි ස්වර නාම වන්නේ, ..................................................................

13 8, 19 දක්වා ඇති යතුරු සඳහා අදාල ස්වර පරාසය හඳුන්වන නාමය වන්නේ, ..................................................................

14 මධ්‍ය සප්තකයේ රි , ග , ම යන ස්වරයන්ට අදාල යතුරු අංක වන්නේ, ..................................................................

15 සරිග , රිගම, මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවරට අදාල ස්වරවලට හිමි යතුරු අංක වන්නේ, ..................................................................

(පංචමය හා ධෛවතය / ශුද්ධ මධ්‍යමය / මධ්‍ය සප්තකය / 9, 11, 14 / 1 2, 13, 15, සඩ්ජය)

- 16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ හරිනම් (✓) හරි ලකුණ ද, වැරදි නම් (✗) වැරදි ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

16 "දෙවන් පහන් මිණි නගා" ........ කිතුණු බැති ගීයකි. (.............)

17 "සිරි සංඝබෝධි මාළිගාවේදී" ගීතය නූර්ති ගීයකි. (.............)

18 තිත් යනු සප්‍රාණික ආඝාතයයි. (.............)

19 සෙමිබ්‍රිව් (Semibreve) හි වටිනාකම මාත්‍රා 4කි. (.............)

20 බොහෝ විට සඳැස්මත් ගණනට වඩා ගීමත් ගණන වැඩි ය. (.............)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු ලියන්න.**

01 (i) කෝමල ග නි ඇතුලත් ඔබ උගත් ස්වර ස්ථාපන ගීතයක පළමු පාද දෙක ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(ල. 06)

(ii) එම ගීතය තුල කුමණ රාගයකට අයත් ස්වර ඇතුළත් වේද? (ල. 02)

(iii) ස රි ගු රි ස

රි ගු ම ගු රි ......... ඉහත නම් කරන ලද රාගයට අදාලව මෙම ස්වර අභ්‍යාසය උච්ච ස දක්වා වර්ධනය කරන්න. (ල. 02)

02 (i) පහත දක්වා ඇත්තේ ඉන්දියානු ගායන ශෛලීන් දෙකක තොරතුරු ය. එම ගායන ශෛලීන් දෙක නම් කරන්න. (ල. 02)

a දෙවියන්ගේ ගුණ ගයයි.

b රවීන්ද්‍රනාත් තාගෝර්තුමා විසින් නිර්මිත ය.

c උත්තර භාරතයේ ප්‍රචලිත ය.

d බෙංගාල ප්‍රදේශයේ ප්‍රචලිත ය.

e මීරාබායි, තුල්සිදාස් ගැන සඳහන් වේ.

f එස්රාජය ප්‍රධාන වාද්‍ය භාණ්ඩයකි.

g සරල ශාස්ත්‍රීය ගායන ශෛලියකි.

h ක්‍රමයෙන් ලය වැඩිකර ගයනු ලබයි.

(ii) එම ගායන ශෛලීන් දෙකට අදාලව ඉහත දක්වා ඇති කරුණු බෙදා දක්වන්න. (ල. 04)

(iii) ඉන් එක් ගායන ශෛලියකට අදාළව ගීතයක කොටසක් ලියන්න. (ල. 04)

03 (i) පහත ගී පාද සඳහා උචිත හින්දුස්ථානි තාලයක් නම් කරන්න. (ල. 02)

(a) / දියගොඩ / සැමතැන / කිරිඉති / රේ s s s /

(b) / ඇසේ s / මතුවන / කඳුළු / බිඳුගෙන /

(c) / සත් / වෙත්ම/ හත් / අදර /

(d) / රොනට / වඩින / බිඟුඹ / බයි s /

(ii) ඉහත නම්කළ තාල අතරින් මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානි තාලයක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 04)

(iii) ඉහත ප්‍රස්තාර කරන ලද හින්දුස්ථානි තාලයට සමාන දේශීය තිත් රූපය නම් කරන්න. එම තිතට අදාල බෙර පදය නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 04)

04 <u>නූර්ති</u> සහ <u>නාඩගම්</u> යන රංග ශෛලීන් පිළිබඳව පහත දැක්වෙන මාතෘකාවන්ට අදාලව කෙටි පිළිතුරු ලියන්න.

(i)
- ආරම්භය
- ප්‍රථම ලාංකික නිර්මාණ ශිල්පීන්
- යොදාගත් සංගීත භාණ්ඩ
- ගී තනු සඳහා පාදක වූ සංගීත ශෛලිය (ල. 04)

(ii) ඔබ උගත් නූර්ති හෝ නාඩගම් ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න. (ල. 04)

(iii) නව නාට්‍යක් නම්කර එහි නිෂ්පාදක සහ සංගීත නිර්මාණකරු නම් කරන්න. (ල. 02)

05 පහත දැක්වෙන හින්දුස්ථානී තාලය ඇසුරින් අංක (i) කොටසට පිළිතුරු සපයන්න.

(1) ⟶ X | O
(2) ⟶ 1 2 3 | 4 5 6
(3) ⟶ ධ ධි න | ධ තු න
(4) ↗ |

(i) (1) , (2) , (3) , (4) කොටස් නම් කරන්න. (ල. 04)

(ii) ගැමි ගීයක ලක්ෂණ 03ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) "පාන්දරම මාමා නුවර ගියා " මෙහි ලඝු, ගුරු, ප්ලුත මාත්‍රා වෙන වෙනම ගණනය කර ලියන්න. (ල. 03)